ආරක්ෂක අමාත්‍යාංශය - මාධ්‍ය කේන්ද්‍රය
பாதுகாப்பு அமைச்சு - ஊடக மையம்
MINISTRY OF DEFENCE - MEDIA CENTRE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையகக்கட்டிடம், ஸ்ரீஜயவர்தனபுர கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayewardenepura, Kotte, Sri Lanka.
Tel : +94 11 2421 419 Fax :+94 11 2421 419 E-mail : Mediacenter@defence.lk

ආඅ/මාකේ/ප්‍ර/20 (I) ( 04 )

අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රවෘත්ති අධ්‍යක්ෂක
............................................................
............................................................ 2026 අගෝස්තු මස 31 වන දින

**<u>මාධ්‍ය ප්‍රචාරයක් ලබාගැනීම - ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම 2027 වර්ෂය</u>**

1. උක්ත කරුණු සම්බන්ධයෙන් ගිනි අවි හිමිකරුවන් දැනුවත් කිරීම සඳහා විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රවෘත්ති විකාශනය අතරතුරදී තිරයේ පහළ තීරුවේ **(News Line)** හි පහත සඳහන් පණිවිඩයන් විකාශනය කර මහජනතාව දැනුවත් කරදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

> "ගිනිඅවි සඳහා බලපත්‍ර හිමි පුද්ගලයින්/ ආයතන 2027 වර්ෂය වෙනුවෙන් සිය ගිනි අවි (තුවක්කු) බලපත්‍ර අලුත් කිරීම 2026.09.01 දින සිට 2026.12.31 දින දක්වා පමණක් සිදු කරන බැවින්, 2026.12.31 වන දිනට ප්‍රථම බලපත්‍ර අලුත්කර ගැනීම සිදුකල යුතුය. එදිනට බලපත්‍ර අලුත් නොකරන සියලු ගිනිඅවි හිමිකරුවන් සඳහා තුවක්කු ආඥාපනතේ 22 වගන්තියේ විධිවිධාන අනුව වලංගු බලපත්‍රයක් රහිතව ගිනිඅවියක් සන්තකයේ තබාගැනීම දඬුවම් ලැබිය හැකි වරදක් බව"

> "2027/2028 වර්ෂ සඳහා පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ලියාපදිංචිය අලුත් කිරීම 2026.09.01 සිට 2026.12.31 දින දක්වා සිදුකෙරෙන අතර, ඉන්පසු සිදුකරන අලුත් කිරීම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව"

2. ඉහත සඳහන් ප්‍රවෘත්ති පලකිරීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය වෙතින් ලබාදෙනු ලබන කාරුණික අනුග්‍රහය ඉතා අගය කොට සලකමි.

**එෆ් ජෝසප් යූඑස්පී**
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂක - මාධ්‍ය කේන්ද්‍රය